# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2306/51 - 2022 නොවැම්බර් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2022.11.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ ඒරාවූර් නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතුකොට ගෙන ඒරාවූර් නගර සභාවේ තෝරා පත්කරගත් සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ ඒරාවූර් නගර සභාවේ අංක 06 පල්ලිඅඩි කොට්ඨාසයට තේරී පත්වූ අබ්දුල් සාලි මුහම්මදු රියාල් අයත් වන්නා වූ මුස්ලිම් ජාතික සන්ධානය (වර්තමානයේ එක්සත් ජාතික සන්ධානය) නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම ඒරාවූර් නගර සභාවේ අංක 06 පල්ලිඅඩි කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා කාලිදීන් ඉස්මත් ඉප්තිකාර් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

ඒරාවූර් නගර සභාවේ තේරීම්භාර නිලධාරි මුහෙයියදීන් බාවා මුහම්මදු සුෆ්යාන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් කාලිදීන් ඉස්මත් ඉප්තිකාර්, ඒරාවූර් නගර සභාවේ අංක 06 පල්ලිඅඩි කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**එම්. බී. එම්. සුෆ්යාන්,**
තේරීම්භාර නිලධාරි,
ඒරාවූර් නගර සභාව.

2022 නොවැම්බර් මස 16 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

EOG 11 - 0182